# සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කට්ටලයක ආකෘතියක් හදමු

- පහත සඳහන් රූප සටහන් හොඳින් අධ්‍යයනය කරන්න. ඒ ඇසුරින් පහත ක්‍රියාකාරකමෙ හි යෙදෙන්න. තව දුරටත් ඔබට තොරතුරු සෙවීම සඳහා අන්තර්ජාලය ද භාවිතා කළ හැක.



1 රූපය



2 රූපය



3 රූපය

01. ඉහත අංක 1,2,3 රූපයන් හි දැක්වෙන නර්තන සම්ප්‍රදායන් සහ රංග වස්ත්‍රාභරණ කට්ටලය පිළිවෙලින් නම් කරන්න.

02. එම රංග වස්ත්‍රාභරණ කට්ටලයන්ට අයත් වන කොටස් වෙන් වෙන් වශයෙන් ලේඛන ගත කරන්න.

03. මෙම රංග වස්ත්‍රාභරණ නිර්මාණය සඳහා යොදා ගෙන ඇති වර්ණ මොනවාදැයි සඳහන් කරන්න.

04. ඉහත රූප සටහන්වල දැක්වෙන රංග වස්ත්‍රාභරණ නිර්මාණය සඳහා යොදා ගෙන ඇති අමු ද්‍රව්‍ය ලේඛනයක් සකස් කරන්න.

05. මෙම රංග වස්ත්‍රාභරණ නිර්මාණයේ දී යොදා ගෙන ඇති රේඛා , හැඩතල පිළිබඳ හොඳින් අධ්‍යයනය කරන්න.

06. ඔබ මෙතෙක් අධ්‍යයනය කළ තොරතුරු ඇසුරෙන් දේශීය නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයේ රංග වස්ත්‍රාභරණ කට්ටලයන් හි සමාන අසමානතා මොනවාදැයි පෙන්වා දෙන්න.

07. මෙම රංග වස්ත්‍රාභරණ කට්ටල නිර්මාණය සඳහා සාම්ප්‍රදායිකව යොදාගෙන ඇති අමු ද්‍රව්‍ය වෙනුවට ඔබට නිවසේ දී භාවිතා කළ හැකි විකල්ප / ආදේශක අමුද්‍රව්‍ය ඇතුලත් ලේඛනයක් සකස් කරන්න.

08. දැන් අපි සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කට්ටලයක එක් කොටසක් තෝරාගෙන එහි ආකෘතියක් නිර්මාණය කරමු. මේ සඳහා පහත සඳහන් පියවරයන් අනුගමනය කරන්න.

- ඔබ කැමති රංග වස්ත්‍රාභරණ කට්ටලයක එක් කොටසක් තෝරා ගන්න.
- එය හොඳින් නිරීක්ෂණය කරමින් රේඛා, වර්ණ, හැඩතල පිළිබඳව අධ්‍යයනය කරන්න.
- සාම්ප්‍රදායික රංග වස්ත්‍රාභරණ කොටස නිර්මාණය සඳහා යොදා ගෙන ඇති අමු ද්‍රව්‍ය වෙනුවට ඔබට නිවසේ දී භාවිතා කළ හැකි විකල්ප / ආදේශක අමු ද්‍රව්‍ය මොනවාදැයි තෝරා ගෙන ඒවා රැස්කර ගන්න.
- ඔබ නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන රංග වස්ත්‍රාභරණ කොටසේ දළ සටහනක් / ආකෘතියක් ඇඳ ගන්න. ( මේ සඳහා ගණකම් කාඩ්බෝඩ් භාවිත කිරීම වඩා සුදුසු වේ )
- ඇඳ ගත් ආකෘතියට අනුව ඔබ රැස් කරගත් අමු ද්‍රවය භාවිතයෙන් අවශ්‍ය කොටස් කපා ගනිමින් ඒවා අලවා ගනිමින් වන රංග වස්ත්‍රාභරණ කොටස නිර්මාණය කරන්න.
- දැන් එය අලංකාර කරගන්න. ( මේ සඳහා ඔබට විසිතුරු ගල් වර්ග, පාට ස්ප්‍රේ වර්ග, සීකුවීන්ස් ආදිය යොදා ගත හැක )

සැකසුම -: ආර්.ඒ. මනුල රත්නායක
ගුරු උපදේශක